ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාව

# SRI LANKA COUNCIL OF ARCHAEOLOGISTS

1992 අංක දරණ පාර්ලිමේන්තු පනතින් නීතිගත කර ඇත

Incorporated Under Act No.04 of 1992

**SLCA**

ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයින්ගේ සභාවේ 2023/2024 වාර්ෂික වාර්තාව

පුරාවිද්‍යා දෙපාර්තමේනතුව, කොළඹ 07

Department of Archaeology, Colombo 07

1. 2023 අප්‍රේල් මාසයේ සිට 2024 මාර්තු මාසය දක්වා ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ පාලක සභා රැස්වීම් 12 ක් පවත්වන ලද අතර විශේෂ පාලක සභා රැස්වීම් 06 ක් පවත්වන ලදී. අධ්‍යයන අනු කමිටුව රැස්වීම් 2 ක් ද, තාක්ෂණික අනු කමිටුවරැස්වීම් 3 ක් ද, සාමාජික අනු කමිටුව රැස්වීම් 2 ක් ද, විනය අනු කමිටුව රැස්වීම් 2 ක් ද පවත්වා ඇති අතර ගිය වර මහ සභාවෙන් පත්කර ගත් අධි සාමාජික අයදුම් පත සංශෝධනය කිරීමේ කමිටුව රැස්වීම් 3 ක් ද පවත්වා ඇත.

2. 2023 මාර්තු 24 වන දින ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ මහා සභාවේ දී පහත සඳහන් පාලක මණ්ඩල සභිකයින් 19 දෙනා තේරී පත්වූ අතර, 2022/23 වර්ෂයේ පැවැත්වූ පාලක සභා රැස්වීම් සඳහා එම සභිකයින්ගේ සහභාගිත්වය පහත සඳහන් වගුවේ දැක්වේ.

| නම | තනතුර | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | අප්‍රේ | මැයි | ජූනි | ජූනි | ජූලි | සැප් | ඔක් | දෙසැ | දෙසැ | ජන | පෙබ | මාර් | % |
| පුරාවිද්‍යාඥ ආචාර්ය ඩබ්.බෝහිංගමුව | සභාපති | පැ | ද | නො | පැ | පැ | පැ | පැ | පැ | පැ | පැ | පැ | පැ | 10/12 83% |
| පුරාවිද්‍යාඥ ආචාර්ය රෝස් සෝලංගආරච්චි | ආසන්න පූර්ව සභාපති | පැ | පැ | පැ | පැ | පැ | පැ | ද | පැ | පැ | ද | ද | ද | 8/12 67% |
| පුරාවිද්‍යාඥ මහාචාර්ය පී.බී.මණ්ඩාවල | ජ්‍යෙෂ්ඨ උප සභාපති | ද | ද | පැ | පැ | පැ | දැ | පැ | පැ | පැ | ද | ද | ද | 6/12 50% |
| පුරාවිද්‍යාඥ චිත්‍රා දඹදෙණිආරච්චි | උප සභාපති | පැ | පැ | පැ | පැ | පැ | පැ | පැ | පැ | පැ | පැ | පැ | පැ | 12/12 100% |
| පුරාවිද්‍යාඥ අයි.ඩී.එම්.විජේබණ්ඩාර | සම ලේකම් | පැ | පැ | පැ | පැ | පැ | පැ | ද | පැ | පැ | පැ | පැ | පැ | 11/12 91% |
| පුරාවිද්‍යාඥ සුජාතා පෙරේරා | සම ලේකම් | පැ | පැ | පැ | පැ | පැ | පැ | පැ | පැ | පැ | පැ | පැ | පැ | 12/12 100% |
| පුරාවිද්‍යාඥ ඩබ්.බී.වැපිටිය | භාණ්ඩාගාරි ක | පැ | පැ | පැ | ද | ද | ද | පැ | පැ | පැ | පැ | පැ | පැ | 9/12 75% |
| පුරාවිද්‍යාඥ එච්.නාමල්ගමුව | උප භාණ්ඩාගාරික | පැ | නො | ද | පැ | පැ | පැ | ද | පැ | ද | පැ | ද | ද | 6/12 50% |
| පුරාවිද්‍යාඥ මහාචාර්ය ආර්.එම්.එම්.චන්ද්‍රරත්න | කාරක සභික | ද | ද | නො | පැ | පැ | පැ | ද | පැ | ද | ද | පැ | පැ | 6/12 50% |
| පුරාවිද්‍යාඥ පූජ්‍ය කන්තලේ සුමිත්ත හිමි | කාරක සභික | පැ | පැ | පැ | පැ | පැ | ද | නො | පැ | පැ | පැ | නො | නො | 8/12 66% |
| පුරාවිද්‍යාඥ පූජ්‍ය රන්නේ සීලවිමල හිමි | කාරක සභික | - | - | - | පැ | පැ | ද | පැ | පැ | ද | පැ | නො | පැ | 6/12 50% |
| පුරාවිද්‍යාඥ අනුරුද්ධ වන්නිනායක | කාරක සභික | පැ | පැ | ද | පැ | පැ | ද | පැ | පැ | පැ | ද | ද | ද | 7/12 58% |
| පුරාවිද්‍යාඥ කලණ මාරසිංහ | කාරක සභික | පැ | ද | පැ | ද | පැ | පැ | ද | නො | ද | පැ | පැ | පැ | 7/12 58% |
| පුරාවිද්‍යාඥ විපුලසේන වීරරත්න | කාරක සභික | පැ | ද | පැ | පැ | නො | නො | ද | නො | පැ | පැ | ද | ද | 5/12 |

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | 41% |
| පුරාවිද්‍යාඥ උපුල් නිශාන්ත | කාරක සභික | නො | නො | පැ | පැ | ද | නො | පැ | නො | පැ | නො | පැ | පැ | 6/12 50% |
| පුරාවිද්‍යාඥ අසංක බුද්ධිකසිරි | කාරක සභික | පැ | ද | ද | පැ | පැ | - | - | - | - | - | - | - | - |
| ප්‍රබුද්ධිකා හෙන්දාවිතාරණ | කාරක සභික | පැ | පැ | පැ | පැ | පැ | නො | ද | නො | පැ | පැ | පැ | පැ | 9/12 75% |
| ඔදේෂිකා කුලතුංග | කාරක සභික | පැ | පැ | පැ | පැ | පැ | පැ | පැ | නො | නො | පැ | නො | පැ | 9/12 75% |
| ෂෙහාන් තිලකරත්න | කාරක සභික | පැ | පැ | පැ | පැ | පැ | පැ | ද | පැ | නො | නො | නො | පැ | 8/12 66% |

**3. අනුකමිටු පත්කිරීම**

2023. 04. වන දින පැවැත් වූ ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ ප්‍රථම පාලක සභාවේ රැස්වීමේ දි ව්‍යවස්ථානුකූලව අනුව පහත සඳහන් අනුකමිටු සඳහා සාමාජිකයින් පත්කර ගන්නා ලදි.

3.1 **අධ්‍යයන අනු කමිටුව**

01. පුරාවිද්‍යාඥ ආචාර්ය ඩබ්.බෝහිංගමුව - සභාපති
02. පුරාවිද්‍යාඥ එච්.නාමල්ගමුව - සම සභාපති
03. පුරාවිද්‍යාඥ මහාචාර්ය ආර්.එම්.එම්.චන්ද්‍රරත්න
04. පුරාවිද්‍යාඥ ආචාර්ය රෝස් සෝලංගආරච්චි
05. පුරාවිද්‍යාඥ පූජ්‍ය ගල්නෑවේ විමලකන්ති හිමි
06. පුරාවිද්‍යාඥ පූජ්‍ය කන්තලේ සුමිත්ත හිමි
07. පුරාවිද්‍යාඥ මහාචාර්ය නුවන් අබේගුණවර්ධන
08. පුරාවිද්‍යාඥ ආචාර්ය ඉසංක මල්සිරි
09. පුරාවිද්‍යාඥ කෞශල්‍යා අබේනායක
10. පුරාවිද්‍යාඥ චිත්‍රා දඹදෙණිආරච්චි
11. පුරාවිද්‍යාඥ අනුරුද්ධ වන්නිනායක
12. පුරාවිද්‍යාඥ උපුල් නිශාන්ත

3.2 විනය අනුකමිටුව

01. පුරාවිද්‍යාඥ ආචාර්ය රෝස් සෝලංගආරච්චි - සභාපති
02. පුරාවිද්‍යාඥ මහාචාර්ය පී.බී.මණ්ඩාවල

03. පුරාවිද්‍යාඥ මහාචාර්ය යමුනා හේරත්

04. පුරාවිද්‍යාඥ චිත්‍රා දඹදෙණිආරච්චි

05. පුරාවිද්‍යාඥ සුජාතා පෙරේරා

තාක්ෂණික අනු කමිටුව

01. පුරාවිද්‍යාඥ කලණ මාරසිංහ -සභාපති

02. පුරාවිද්‍යාඥ අසංක බුද්ධිකසිරි

03. පුරාවිද්‍යාඥ කසුන් ජයසූරිය

04. පුරාවිද්‍යාඥ රංගිකා

05. ප්‍රබුද්ධිකා හෙන්දාවිතාරණ

06. ඔදේෂිකා කුලතුංග

07. ෂෙහාන් තිලකරත්න

web master - පුරාවිද්‍යාඥ කලණ මාරසිංහ

සාමාජික අනුකමිටුව

01. පුරාවිද්‍යාඥ අනුරුද්ධ වන්නිනායක - සභාපති

02. පුරාවිද්‍යාඥ අයි.ඩී.එම්.විජේබණ්ඩාර

03. පුරාවිද්‍යාඥ සුජාතා පෙරේරා

04. පුරාවිද්‍යාඥ ඩබ්.බී.වැපිටිය

05. පුරාවිද්‍යාඥ තුෂාරි වික්‍රමසිංහ

06. පුරාවිද්‍යාඥ අසංක බුද්ධිකසිරි

07. පුරාවිද්‍යාඥ එච්.නාමල්ගමුව

08. ෂෙහාන් තිලකරත්න

සේවා ව්‍යවස්ථා කමිටුව

01. පුරාවිද්‍යාඥ මහාචාර්ය යමුනා හේරත්

02. පුරාවිද්‍යාඥ මහාචාර්ය පී.බී.මණ්ඩාවල

03. පුරාවිද්‍යාඥ ආචාර්ය රෝස් සෝලංගආරච්චි

04. පුරාවිද්‍යාඥ ආචාර්ය ඩබ්.බෝහිංගමුව

05. පුරාවිද්‍යාඥ පූජ්‍ය කන්තලේ සුමිත්ත හිමි

06. පුරාවිද්‍යාඥ චිත්‍රා දඹදෙණිආරච්චි

07. පුරාවිද්‍යාඥ අයි.ඩී.එම්.විජේබණ්ඩාර

08. පුරාවිද්‍යාඥ සුජාතා පෙරේරා

09. පුරාවිද්‍යාඥ ඩබ්.බී.වැපිටිය

10. පුරාවිද්‍යාඥ අනුරුද්ධ වන්නිනායක

11. පුරාවිද්‍යාඥ තුෂාරි වික්‍රමසිංහ

පුරාවිද්‍යාත්මක අධ්‍යයන මණ්ඩලය

01. පුරාවිද්‍යාඥ මහාචාර්ය පී.බී.මණ්ඩාවල

02. පුරාවිද්‍යාඥ මහාචාර්ය ආර්.එම්.එම්.චන්ද්‍රරත්න

03. පුරාවිද්‍යාඥ ආචාර්ය රෝස් සෝලංගආරච්චි

ප්‍රසම්පාදන කමිටුව

01. පුරාවිද්‍යාඥ මහාචාර්ය පී.බී.මණ්ඩාවල සභාපති

02. චින්තක සදරුවන්

03. ඔදේෂිකා කුලතුංග

4. 2023/24 වර්ෂයේදි පාලක සභාවේ න්‍යාය පත්‍රයේ ප්‍රධාන ශිර්ෂයන් පහතින් දැක්වේ.

4.1 පුරාවිද්‍යා සේවා ව්‍යවස්ථාව

4.2 ගරු සභාපතිතුමිය ගේ ධුරය හැර යාමේ සිද්ධිය සම්බන්ධව

4.3 පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ පනත සංශෝධනය කිරිම

4.4 පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ උසස්වීම් හා ශ්‍රේණිගත කිරීම් සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණයේ විභාග වන නඩුව

4.5 මධ්‍යම සංස්කෘතික අරමුදලෙ ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධ ගැටළුව

4.6 පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ හා පුරාවිද්‍යා වෘත්තිකයන්ගේ ගැටළුවලට සභාවේ මැදිහත්වීම්

4.7 අනුකමිටු ප්‍රගතිය

4.8 වෙනත් කරුණු

**4.1 පුරාවිද්‍යා සේවා ව්‍යවස්ථාව**

සේවා ව්‍යවස්ථා ස්ථාපිත කර ගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාව මෙම වසරේ ද ජාතික උරුමයන්, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා කටයුතු ප්‍රවර්ධන අමාත්‍යාංශයේ ගරු විෂයභාර අමාත්‍යවරයා සමග සභාවේ ඉල්ලීම පරිදි සාකච්ඡා කරන ලදී. ගරු අමාත්‍යතුමාගේ අදහස වූයේ රටෙහි පවතින ආර්ථික තත්ත්වය මත මේ අවස්ථාවේ දී කැබිනට් මණ්ඩලයෙන් සේවා ව්‍යවස්ථාවක් සකස් කිරීම සඳහා අනුමැතියක් ලැබීමේ ඉඩකඩ ඉතා අඩු බවත් ප්‍රතික්ෂේප වීමට ඇති ඉඩකඩ ඉතා වැඩි බවත් ය. එසේ ම මේ සම්බන්ධව සාකච්ඡා කිරීම සඳහා ගරු අගමැතිතුමා වෙත තමා විසින් ලිපියක් යවා ඇති බව විෂය භාර අමාත්‍යතුමා විසින් පුරාවිද්‍යාඥයින්ගේ පාලක සභාවේ ආසන්න පූර්ව සභාපතිතුමිය දැනුවත් කර තිබිණි.

ඒ අනුව සභාවේ අදහස වූයේ ගරු අගමැතිතුමන් වෙත සභාවේ ලිපි ශීර්ෂයෙන්ද සාකච්ඡාවක් සඳහා ඉදිරිපත් කිරීමයි ඒ අනුව විෂය භාර අමාත්‍යතුමාටද පිටපතක් සහිතව ගරු අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතා වෙතට ලිපියක් යැවීමට කටයුතු කරන ලදී.

මේ සම්බන්ධයෙන් පාලක සභාව තුළ දිගින් දිගට ම සාකච්ඡා සිදු වූ අතර විශේෂයෙන් ම ගරු විෂය භාර අමාත්‍ය තුමා විසින් ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත්තේ පුරාවිද්‍යා සේවා ව්‍යවස්ථාවක් සකස් කිරීමේ කෙටුම්පත ද නැතහොත් පුරාවිද්‍යාඥයින් දීපව්‍යාප්තව ස්ථානගත කිරීමේ අවස්ථාවන් හි පෙන්වා සකස් කළේ ලේඛනය ද යන්න සභාව විසින් දැනගත යුතු බවට සභාවේ අදහස විය. මෙහි දී මේ සම්බන්ධයෙන් ගරු විෂය භාර අමාත්‍යතුමාගෙන් විමසීමක් සිදුකිරීමට ද තීරණය කරගන්නා ලදී. ඉතා දීර්ඝ කාලයක පුරාවිද්‍යා සේවා ව්‍යවස්ථාවක් සකස්කර ක්ෂේත්‍රයේ සිටින පුරාවිද්‍යාඥයින්ට තම වෘත්තීයභාවය ආරක්ෂා කරගෙන කටයුතු කිරීමේ අවස්ථාව උදාකර ගැනීමට උත්සාහ කළ ද එය මෙතෙක් සාර්ථක නොවූ බවට පාලක සභාවේ දී සාකච්ඡා විය. වරින් වර විෂයභාර අමාත්‍යාංශයේ කටයුතු කළ අමාත්‍යවරුන් විෂයභාර ලේකම්වරුන් සමඟ ද සාකච්ඡා කළ ද මේ සම්බන්ධයෙන් ප්‍රගතියක් පෙන්නුම් කිරීමට නොහැකි වූ බව සභාවේ අදහස වූ අතරින් සඳහා රටෙහි පවතින වත්මන් ආර්ථික තත්ත්වය ද බෙහෙවින් ම බලපා ඇති බව යි. එසේ ම මේ කරුණ ඇතුළු කරුණු කිහිපයක් සම්බන්ධයෙන් සාකච්ඡාවක් සභාව විසින් ඉල්ලා සිටි අතර ඒ අනුව 2024.01.02 විෂයභාර අමාත්‍යවරයාගේ සහ ලේකම්තුමියගේ ප්‍රධානත්වයෙන් රැස්වීමක් පාලක සභාව වෙත ලබා දී තිබුණි. එම හමුවේ දී මේ පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සාකච්ඡාව සිදු කරන ලදී.

01. මධ්‍යම සංස්කෘතික අරමුදලේ බඳවා ගැනීම් සහ ප්‍රතිව්‍යුහගත කරන වැඩ පිළිවෙළ සම්බන්ධව එහිදී මධ්‍යම සංස්කෘතික අරමුදලේ ප්‍රතිව්‍යුහගත කරන වැඩ පිලිවෙළට සභාවේ නියෝජනයක් ඉල්ලා සිටි ඒ සම්බන්ධව එකගතාව පළ කරන ලදී.

02. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පුරාවිද්‍යා නිලධාරි තනතුර අහෝසිවීම සම්බන්ධව ගැටළුව

03. පුරාවස්තු ආඥාපනත සංශෝධනය කිරීම සම්බන්ධව - මෙහිදී පනත සංශෝධනය කිරීමට උත්සහ කළද එය සම්පූර්ණයෙන් නැවත සකස් කිරීමට කැබිනට් මණ්ඩලයෙන් අනුමැතිය ලද බව දන්වන ලදී.

## 4.2 ගරු සභාපතිතුමිය ගේ ධුරය හැර යාමේ සිද්ධිය සම්බන්ධව

2023.06.16 දින ගරු සම ලේකම්වරුන් වෙත whatsapp මගින් යොමු කර තිබූ ලිපියකට අනුව ගරු සභාපති මහාචාර්ය යමුනා හේරත් මහත්මිය සභාවේ සභාපති ධුරයෙන් ඉල්ලා අස්වන බව දැනුම් දී තිබුණි. මෙම තත්වය මත zoom තාක්ෂණය ඔස්සේ හදිසි සභාවක් කැඳවීමට සම ලේකම්වරුන් විසින් තීරණය කරන ලදී. ඒ අනුව 2023.06.16 දින පැවැත් වූ සාකච්ඡාව සඳහා ගරු සභාපතිතුමියට සබාගි වන ලෙස දැනුම් දුන්න ද ඇය එම අවස්ථාව ප්‍රතික්ෂේප කරමින් whatsapp පණිවිඩයක් ලබා දී තිබුණි. ඒ අනුව 1992 අංක 04 දරණ පාර්ලිමේන්තු පනතේ හා එහි බලතල ප්‍රකාරව ප්‍රකාශයට පත් කර ඇති ගැසට් පත්‍රවල ව්‍යවස්ථාවන්ට අනුකූලව මී ළඟ සභාපතිවරයා පත් කර ගත යුතු විය. ඒ අනුව එම බලතල ප්‍රකාරව ජ්‍යෙෂ්ඨ උප සභාපති තනතුරෙහි කටයුතු කළ ආචාර්ය බෝහිංගමුව මහතා සභාපති ධුරයෙහි කටයුතු කිරීමට පාලක සභාව ඒකමතිකව පත් කර ගන්නා ලදී. එවිට හිස් වූ ජ්‍යෙෂ්ඨ උප සභාපති තනතුර සඳහා උප සභාපති ධුරයෙහි කටයුතු කළ මහාචාර්ය පී.බී.මණ්ඩාවල මහතා පත් කෙරිණි. හිස් වූ උප සභාපති ධුරය සඳහා කාරක සභික තනතුරුවල කටයුතු කරන අධි සාමාජිකයෙක් තෝරා පත්කර ගත යුතු වූ අතර ඒ සඳහා පුරාවිද්‍යාඥ චිත්‍රා දඹදෙණිආරච්චි මිය සභාවේ ඒකමතික ව පත් කර ගන්නා ලදී. එම පත් වීම අනුව කාරක සභික ධුරයෙහි එක්

තනතුරක් හිස් වූ අතර මෙවර මහ සභාවේ අවසන් මනාප ලබා ගත් පූජ්‍ය රන්නේ සීලවිමල හිමියන් පත් කර ගැනීමට තීරණය විය. ඒ අනුව උන් වහන්සේගෙන් කැමැත්ත විමසා එම පත් කිරීම සිදු කිරීමට යෝජනා විය.

මෙහි දී සභාපති ධූරය හැර ගිය සභාපතිතුමියට ආසන්න පූර්ව සභාපති තනතුරට අයිතියක් ඉදිරිපත් කිරිමේ අවස්ථාවක් ඇති ද යන්න ගැටළුක් මතුවූ අතර මේ සම්බන්ධයෙන් ව්‍යවස්ථානුකූල ප්‍රතිපාදන නොමැති බවත් එබැවින් ආසන්න පූර්ව සභාපති ධූරයට හිමිකම් කීමට අවස්ථාවක් නොමැති බවත් පාලක සභාව තීරණය කරන ලදී. මෙවැනි තත්වයක දී කටයුතු කළ අකාරය පිළිබද ගැසට් පත්‍රයේ ප්‍රතිපාදන තව දුරටත් සංශෝධනය විය යුතු බව පාලක සභාවේ තීරණය විය. එසේම 2024 මහ සභාවාරයේ දී මේ සදහා කමිටුවක් පත් කර ගත යුතු බවත් ඒ සදහා අනුමැතියක් ලබා ගත යුතු බවටත් තීරණය විය.

ඉහත ව්‍යාකූල තත්ත්වය යටතේ 2024 මාර්තු මහ සභා නිලවරණයේ දී ජ්‍යෙෂ්ඨ උප සභාපති තනතුර සදහා ද අයදුම්පත් කැඳවන අතර මේ සදහා ඉහත සඳහන් කළ පරිදි සභාවේ පනත හා ගැසට් පත්‍රයේ 13 සහ 14(අ,ආ) වගන්තිවලට අනුකූලව මෙම පත්කිරීම් ඊළග පාලක මණ්ඩලය පත්වන තුරු වන බැවින් 2024 මහ සභා අවස්ථාවේ දී මෙම තනතුරු අහෝසි වීමට නියමිතය. එසේ නොවුනහොත් 2025 වර්ෂය දක්වාම වැඩබලන තනතුරු ලෙස මෙය බලපැවැත්විය යුතුය.

මෙවන් අවස්ථාවන්හි දී අනුගමනය කළ යුතු පිළිවෙත පිළිබද **නිශ්චිත අර්ථකතනයක් අදාළ අණ පනත් හි නොමැති පසුබිමක ව්‍යවස්ථානුකූලව පාලක සභාවට ඇති බලතල ප්‍රකාරව, තවදුරටත් මෙම තත්වය පැවතීම ගැටළු රැසකට හේතු වන්නක් විය හැකිය.** මෙම තත්ත්වයමත දැනට ජ්‍යෙෂ්ඨ උප සභාපති තනතුර **හොබවන** පුරාවිද්‍යාඥ ආචාර්ය ඩබ්.බෝහිංගමුව මහතා නිත්‍ය වශයෙන් සභාපති තනතුරේ කටයුතු කිරීම ඉදිරි මහ සභාවේ නිල වශයෙන් ආරම්භ වීමට නියමිත ය. එම නිසා ජ්‍යෙෂ්ඨ උප සභාපති තනතුර හිස්වන අතර ඒ සදහා සුදුස්සෙකු පත් කර ගැනීමට **2024 මහ සභා නිලවරණයට නාම යෝජනා කැඳවීමේ දී** ජ්‍යෙෂ්ඨ උප සභාපති තනතුර ද ඇතුළත් කළ බැව් වැඩිදුරටත් සදහන් කරමු.

අනතුරුව අනපේක්ෂිත අවස්ථාවක තමාට පැමිණි අභියෝගය සභාවේ උන්නතිය වෙනුවන්භාර ගන්නා බවත්, හිටපු සභාපතිවරුන්ගෙන් තමාට මග පෙන්වීම හා සහයෝගය ඉල්ලා සිටින බවත්, සම ලේකම්වරුන්ගෙන් හා පාලක සභාවේ නව පත්වීම් හා අනෙකුත් සියළු ම නිලධාරීන්ගෙන් සහයෝගය බලාපොරොත්තු වන බවත් සභාව අමතමින් අභිනව සභාපතිතුමන් ප්‍රකාශ කර සිටියේ ය.

### 4.3 ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ පනත සංශෝධනය කිරීම

ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ පනත සංශෝධනය කිරීමේ කාර්යය සම්බන්ධයෙන් පාලක සභාවේ වරින්වර සාකච්ඡා වූ අතර, ඒ සංශෝධනය සඳහා මහ සභාවේ අනුමැතිය ලැබී ඇති බැවින්, එය පාර්ලිමේන්තුවේ සම්මත කර ප්‍රකාශයට පත්කිරීමේ කාර්යය සිදු කළ යුතුව ඇත. මේ සම්බන්ධයෙන් ද 2024.01.02 දින පැවති ගරු ඇමතිතුමා සමඟ කළ සාකච්ඡාවේ දී ද කරුණු ඉදිරිපත් කළ අතර එහි දී එම සංශෝධිත වාර්තාවේ දැනට ඇති වගන්තිය හා සංශෝධනය වූ වගන්තිය වශයෙන් වෙන් වෙන් ව තමාට වාර්තාව ලැබීමට සලස්වන ලෙසත්, දන්වා තිබූ අතර මේ වනවිට මෙම වාර්තාව ගරු ඇමතිතුමා වෙත ලබා දී ඇත. මෙම සංශෝධිත පනත සහිත වාර්තාව ගරු පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර එහි දී අනුමත කරගත යුතු අතර එය විෂයභාර අමාත්‍යවරයාගේ යටතේ දැනට පවතී.

### 4.4 පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ උසස්වීම් හා ශ්‍රේණිගත කිරීම් සම්බන්ධ ශ්‍රේෂ්ඨාධිකරණයේ විභාගවන නඩුව

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ උපාධිධාරී නිලධාරීන් විසින් මේ වන විට ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කර ඇති මානව හිමිකම් නඩුවේ වගඋත්තරකරුවෙකු ලෙස පුරාවිද්‍යාඥයන්ගේ සභාව නම් කර ඇත. එහෙත් මෙම කරුණ සම්බන්ධයෙන් පසුගිය සභාපතිවරුන් ද පුරාවිද්‍යාඥයන්ගේ සභාව වශයෙන් ගරු අධිකරණයට කරුණු දක්වූ අතර, එහි දී තම සාමාජිකත්වය මෙම ඉදිරිපත් කර ඇති කරුණු සම්බන්ධයෙන් අගතියට පත්ව ඇති බවත්, ඒ සම්බන්ධයෙන් තම සභාව ද පෙනී සිටින බවත් ප්‍රකාශ කර ඇත. ඒ අනුව

පසුගිය පාලක සභාවල දී ද සාකච්ඡා කෙරුණු අතර පැමිණිල්ලේ පාර්ශවයේ නීතිඥවරුන් හමුවී ඉදිරියට ගතයුතු ක්‍රියා මාර්ග සම්බන්ධයෙන් සාකච්ඡා කළ යුතු බවට තීරණය විය.

#### 4.5 පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ හා වෘත්තිකයින්ගේ ගැටළුවලට සභාවේ මැදිහත්වීම්

- පසුගිය වසර තුළ පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ වෘත්තිකයින්ගේ ගැටළු සඳහා ද පුරාවිද්‍යාඥයන්ගේ සභාව මැදිහත් වූ අතර, එහි දී ගැටළු සහගත ස්ථාන මාරුවීම් එකක් සම්බන්ධව මධ්‍යම සංස්කෘතික අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලිඛිතව දැනුවත් කරන ලදී. මේ සම්බන්ධව මධ්‍යම සංස්කෘතික අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සභාවට පිළිතුරු ලිපියක් යොමු කර තිබූ අතර එයින් දන්වා සිටියේ එම ගැටළුව ආයතනික ගැටළුවක් බවත් ඒ සඳහා දැනට අභ්‍යයන්තර විමර්ශනයක් ක්‍රියාත්මක වන බවත් එය නිම වූ පසුව සභාව දැනුවත් කරන බවත් ය.
- මීට අමතරව පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ සිදු වූ විවිධ සිද්ධීන් සම්බන්ධයෙන් පුරාවිද්‍යාඥයන්ගේ සභාව ලෙස මැදිහත්වීම් සිදු කළ අතර, ඒ අතරින් වවුනියාව කුරුන්දි විහාරය ආශ්‍රිතව සිදුකරන ලද ඉදිකිරීම් සම්බන්ධව සභාව කටයුතු කළ අතර ප්‍රධාන ම වගකිවයුතු ආයතනය වන පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙත සභාවේ ස්ථාවරත්වය ලිඛිතව දැනුම්දීම් කරන ලදී. එසේ ම මේ සම්බන්ධයෙන් මාධ්‍ය සාකච්ඡාවක් පැවැත්වීමටත් ගරු ජනාධිපතිතුමා වෙත කරුණු දක්වා ලිපියක් යවන ලදී.
- මහනුවර පුරාවිද්‍යා ආරක්ෂිත ස්මාරකයක් වශයෙන් නම් කර ඇති උල්පැන් ගෙය සහ මගුල් මඩුව ස්මාරකය දළදා මාලිගාවට පවරන ලෙස ං දන්වා ලිපියක් ලැබී තිබුණු අතර මේ සම්බන්ධව මහනුවර පළාත් පුරාවිද්‍යා කාර්යාලයේ නිලධාරීන් විසින් සභාවට මැදිහත්වීමක් සිදුකර මෙම ගොඩනැගිල්ල පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව භාරයේ තබාගෙන කටයුතු කිරීමට අවශ්‍ය මැදිහත්වීම කරන ලෙස ඉල්ලා තිබුණි. ඒ අනුව මෙම ගොඩනැගිල්ලෙහි ඇති පුරාවිද්‍යාත්මක වැදගත්කමත්, එය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව භාරයේ තබා ගැනීමේ ඇති වැදගත්කමත් සඳහන් කරමින් ගරු ජනාධිපතිතුමා සහ විෂයභාර අමාත්‍යවරයා වෙත ලිඛිතව සභාව විසින් යොමු කරන ලදී. මේ සම්බන්ධව පාලක සභාව විසින් දිගින් දිගට ම සාකච්ඡා කළ අතර මෙම ස්මාරකවල අයිතිය වර්තමානය වන විට කා සතු ද යන්නත් සොයා බැලීමට ද තීරණය ය. එසේම වරින්වර මෙම කරුණ සම්බන්ධයෙන් විෂයභාර ලේකම්වරයා ද දැනුවත් කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස මහනුවර උල්පැන් ගෙය ස්මාරකය පුරාවිද්‍යා දෙපාතමේන්තු භාරයේ පවතී.
- කොළඹ වරාය පරිශ්‍රයේ පිහිටි පැරණි ඕලන්ද බඩු ගබඩාවක් වූ ලේකම් කාර්යාල ගොඩනැගිල්ල අධිවේගී මාර්ග ව්‍යාපෘතියක් හේතුවෙන් විනාශ කිරීම සිදුවන බවට පුරාවිද්‍යාඥයන්ගේ සභාවට පිටපතක් සහිතව විගණන කාර්යාලයට ගරු විෂයභාර අමාත්‍යතුමා විසින් යොමු කර තිබුණි. මේ සම්බන්ධයෙන් ද පාලක සභාවේ සාකච්ඡා වූ අතර සෑම ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට පෙර පුරාවිද්‍යා හානි ඇගයීමක් සිදු කරගත යුතු බව තීරණය වූ අතර ඒ සම්බන්ධව පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා දැනුවත් කිරීමට ද තීරණය විය.
- ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවාගැනීම සම්බන්ධව මධ්‍යම රජයෙන් පලකර තිබූ පුවත්පත් දැන්වීම්වල පුරාවිද්‍යා උපාධිධාරීන්ට ඉල්ලුම් කිරීමට නොහැකිවන ලෙස සකස් කර තිබූ අතර මේ සම්බන්ධව මැදිහත්වීමක් සිදු කරන මෙන් ඉල්ලා ලිපියක් ගරු ජනාධිපතිතුමාට, ගරු අගමැතිතුමාට සහ එහි පිටපත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ගරු ඇමතිතුමාට, විෂයභාර අමාත්‍යතුමාට සහ ඒ ඒ අමාත්‍යාංශවල ලේකම්වරුන්ට ද යොමු කරන ලදී. මෙහි ප්‍රතිලයක් ලෙස පළාත් කිහිපයක ගුරු පුරප්පාඩු සඳහා ඉල්ලුම් කිරීමට හැකිවන ලෙස ගැසට් පත්‍රය සංශෝධනය කර තිබිණි.
- මධ්‍යම සංස්කෘතික අරමුදල ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධයෙන් ඇති වූ සාකච්ඡා සඳහා පුරාවිද්‍යාඥයන්ගේ සභාවට නියෝජනයක් ලබා දෙන ඉල්ලා ලිපියක් මධ්‍යම සංස්කෘතික අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල් වෙත යවන ලද අතර ඒ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පිළිතරු ලිපියක් සභාවට නොලැබිණි.
- මධ්‍යම සංස්කෘතික අරමුදලේ වාර්ෂික ස්ථාන මාරු කමිටුව සඳහා සභාවේ නියෝජනයක් ලබා දෙන ලෙස ඉල්ලා අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිපියක් යවන ලද අතර ඒ සම්බන්ධයෙන් නියෝජනයක් ලබා දිය හැකි බවට පිළිතුරු ලිපියක් සභාවට ලැබුණි. ඒ අනුව පාලක සභාව නියෝජනය කරමින් පුරාවිද්‍යාඥ චිත්‍රා දඹදෙණිආරච්චි මහත්මිය ඒ සඳහා පත්කර යැවිණි.

#### 4.7 අනුකම්ටු ප්‍රගතිය

**අධ්‍යයන අනුකම්ටුව**

පුරාවිද්‍යා උපාධි අපේක්ෂකයින් හා සභාවේ සාමාජිකත්වය නියෝජනය කරමින් විසිදෙනා බැගින් කණ්ඩායම් දෙකක අරමුණු කොට පුරාවස්තු විශ්ලේෂණය කිරීමට පුරාවිද්‍යා උපාධිධාරීන් හා උපාධි අපේක්ෂකයින් අරමුණු කොට පුරාවස්තු විශ්ලේෂණය කිරීමට පුරාවිද්‍යා පශ්චාද් උපාධි ආයතනයේ දී පැවැත්වීමට සංවිධානය කළ නමුත් මූල්‍ය දුෂ්කරතා හා පුරාවිද්‍යා උපාධි ආයතනයේ ක්ෂේත්‍ර පුහුණු වැඩසටහන් හා මෙම වැඩසටහන ගැටුණ බැවින් පැවැත්වීමට නොහැකි විය. මේ සඳහා උපාධි මෙම වැඩමුළුව මහාචාර්ය සේනක බණ්ඩාරනායක ක්ෂෙත්‍ර පුහුණු පාසලෙන් මෙය ඉටු කර ගැනීමට යෝජනා විය. එබැවින් ඉදිරියේ දී පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය හා මධ්‍යම සංස්කෘතික අරමුදලේ සම දායකත්වයෙන් මෙම වැඩ මුළුව පැවැත්වීමේ හැකියාව සොයා බැලීමට යෝජනා විය.

එමෙන් ම මාර්ගගතව කාලීන මාතෘකා යටතේ දේශන මාලාවක් පැවැත්වීමට කටයුතු සම්පාදනය කළත් එය සැලසුම් කළ පරිදි කරගැනීමට නොහැකි විය.

**සාමාජික අනුකමිටුව**

මෙම වර්ෂයේ සභාවේ මූලිකම අවධානය යොමු වූයේ සභාවේ සාමාජික තොරතුරු යාවත්කාලීන කොට දත්ත බැංකුවක් සකස් කිරීමයි.

ඒ අනුව මෙතෙක් සභාවේ ලිපි ගොනු සහ සාමාජිකත්වයේ මුදල් ගෙවීම් ආදිය යාවත්කාලීන කිරීම සඳහා වැඩමුළු කිහිපයක් සාමාජික අනු කමිටුවේ ප්‍රධානත්වයෙන් කෝට්ටේ පුරාවිද්‍යා කෞතුකාගාර නිලනිවසේ දී සිදු කරන ලදී. ඒ සඳහා සාමාජික අනුකමිටුවේ සභාපතිතුමා, ගරු සභාපති, ගරු සමලේකම්වරු ඇතුළුව නිලධාරීන් පිරිසක් සහභාගි වූ අතර, එහි දී වසර කිහිපයක් තිස්සේ සාමාජික මුදල් නොගෙවූ සාමාජිකයන්ගේ ලේඛනයක් සකස් කරන ලද අතර ඒ බව ඔවුන්ට දන්වා සාමාජික මුදල් අයකර ගැනීමට කටයුතු කරන ලදී.

පසුගිය මහ සභාවේ දී පුරාද්‍යාඥ අනුෂා කාරියවසම් මහත්මිය විසින් ඉදිරිපත් කර තිබූ අධි සාමාජිකත්ව ස්වයං ඇගයුම් පත්‍රය සංශෝධනය කිරීමේ කමිටුව කිහිප වාරයක් රැස්වූ අතර එහිදී සාමාජිකයන් ද ලකුණු ලබා ගත හැකි වන මාවත් සකස් කිරීමත්, අයදුම් පත්‍රයේ ගුණාත්මක බව රැකගැනීමටත් කමිටුව කටයුතු කරන ලදී. ඒ අනුව දීර්ඝ සාකච්ඡාවාර කිහිපයකින් හා විවිධ තර්ක විතර්ක මධ්‍යයේ සකස් කරන ලද අයදුම් පත සාමාජිකත්වය වෙත යොමු කර ඇත.

සාමාජික අනුකමිටුව අවස්ථා 03 ක හමු වූ අතර එහිදී පාලක සභාවට ලැබුණු සාමාජිකත්ව අයදුම්පත් පරීක්ෂා කර අධි සාමාජිකත්ව 05 ක් ද, , ලියාපදිංචි සාමාජිකත්ව 01 ක් ද, ශිෂ්‍ය සාමාජිකත්ව 120 ප්‍රමාණයක් ද ප්‍රදානය කරන ලද අතර, එම සාමාජිකයින්ට අයත් සහතික පත්‍ර 2024. 03. 28 දින ගරු මහ සභාවේ දී ප්‍රදානය කිරීමට කටයුතු යොදා ඇත. ඒ අනුව සභාවේ මුළු සාමාජිකත්වය අධි සාමාජික 52 සාමාජික 168 ආශ්‍රිත සාමාජික 26 ලියාපදිංචි සාමාජික 62 ශිෂ්‍ය සාමාජික 906 වශයෙන් වන්නේය. ඒ අනුව සියළු සාමාජිකත්වය 1214 කින් සමන්විත වන්නේ ය.

**තාක්ෂණික අනුකමිටුව**

තාක්ෂණික කමිටුවේ මූලික අවධානය යොමු වූයේ ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ කටයුතු කාර්යක්ෂමව සංනිවේදනය කිරීමට හා සභාවේ නිල මුහුණු පොත හා වෙබ් අඩවිය සක්‍රිය කොට යාවත්කාලීන කිරීම පහසු කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම යි. ඒ සඳහා සභාවට Laptop පරිගණක යන්ත්‍රයක් මිලදී ගැනීමට සහ Router උපකරණයක් මිලදී ගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලදී. ඒ අනුව තාක්ෂණික කමිටුවෙන් ලබා දුන් පිරිවිතර අනුව Laptop යන්ත්‍රය සඳහා මිල ගණන් කැඳවූ අතර, ඒවා ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කර එය මිලදී ගැනීම අවසන් කරන ලදී. පෙර ගෙවුම් ක්‍රමය යටතේ මිලදී ගත් Router උපකරණය දැනට සභාවේ කටයුතු සඳහා යොදා ගෙන ඇත.

සාමාජිකයන් සඳහා හැඳුනුම්පතක් ලබා දීමේ කාර්ය තාක්ෂණික අනු කමිටුව යටතේ තව දුරටත් සිදු කළ අතර ඒ සඳහා Google Form මගින් තොරතුරු රැස් කිරීමට කටයුතු කරන ලදී.

සභාවේ මුහුණු පොත ද (Facebook), වෙබ් පිටුව ද වරින් වර යාවත් කාලීන කරන ලද අතර සාමාජික අයදුම් පත, මෙවර කැඳවීමේ ලිපිය සහ නාම යෝජනා ඉල්ලුම් පත උඩු ගත කිරීමට කටයුතු කරන ලදී.

**විනය අනුකමිටුව**

ශිෂ්‍ය සාමාජිකයත්වය දරණ එක් සාමාජිකයෙක් සම්බන්ධව විනය අනුකමිටුව රැස්වී සාකච්ඡා කළ අතර ඔහු විනය කමිටුව වෙත කැඳවා කරුණු විමසීමට කටයුතු කරන ලදී. එම සාමාජිකයා ඒ සඳහා සහභාගි නොවූ බැවින් සාමාජික අනු කමිටුවේ ද නිර්දේශ මත තීරණයක් ගැනීමට සාකච්ඡා කර ගන්නා ලදී.

**ගිණුම් වාර්තාව**

මෙම මුදල් වර්ෂයට අදාළ විගණනය කරන ලද ගිණුම් වාර්තාව ගරු භාණ්ඩාගාරිකතුමා විසින් අද දින සභාවට ඉදිරිපත් කරනු ලැබේ.

ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ සමලේකම්වරු වශයෙන් විවිධ අර්බුද හා අභියෝග හමුවේ පසුගිය වසරක කාලය තුළ දී අපහට පැවරී තිබූ කාර්යයන් ඉටුකර ගැනීමට නන් අයුරින් සහයෝගය දැක්වූ ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ පාලක සභා සියළු සාමාජිකයන් ඇතුළු ගරු සභාපතිතුමියටත්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හා මධ්‍යම සංස්කෘතික අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල් තුමන්ලාටත්, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්තුමියටත් අද දින පැමිණි සාමාජික සාමාජිකයන්ටත් අපගේ හෘදයාංගම කෘතඥතාව පළ කරමු.





පුරාවිද්‍යාඥ ආචාර්ය අයි.ඩී.එම්.විජේබණ්ඩාර
සම ලේකම්
ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාව

පුරාවිද්‍යාඥ සුජාතා පෙරේරා
සම ලේකම්
ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාව

2024.03.28 දින දීය.